# මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය සඳහා වන ප්‍රජා මැදිහත්වීම් පිළිබඳ පළමු ජාතික සම්මන්ත්‍රණය

*" මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය උදෙසා ප්‍රජාවන් ශක්තිමත් කිරීමේ නව්‍ය ප්‍රවේශ සහ වඩාත් හොඳ භාවිතාවන් එළිදැක්වීම"*

**2024 දෙසැම්බර් 04, කොළඹ**

## පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ

සියලුම පර්යේෂණ පත්‍රිකා / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා විශේෂඥ මණ්ඩලයක් විසින් සමාලෝචන ක්‍රියාවලියකට යටත් කරනු ලැබේ. මීට ප්‍රථම ප්‍රකාශනය නොකළ පර්යේෂණ පත්‍රිකා / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා පමණක් මේ සඳහා සුදුසුකම් ලබයි. වෙනත් සම්මන්ත්‍රණයක් හෝ ප්‍රකාශනයක් සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇති හෝ සමාලෝචනයට ලක්ව ඇති පර්යේෂණ පත්‍රිකා / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා සලකා බලනු නොලැබේ. ඔබේ පර්යේෂණ පත්‍රිකාව / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තාව තෝරාගනු ලැබුවහොත්, අවම වශයෙන් එක් කතුවරයකු සම්මන්ත්‍රණය සඳහා ලියාපදිංචි වී එය ඉදිරිපත් කළ යුතුය.

### 1. යෝජිත තේමාවන්

**I. ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණය (මද්‍යසාර සහ දුම්කොළ ඇතුළත්ව)**

- ප්‍රජාමූල සංවිධානවල භූමිකාව
- ප්‍රජා නායකයින්ගේ සහ ස්වේච්ඡා සේවකයින්ගේ භූමිකාව
- මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා කාන්තාවන් බලගැන්වීම
- පවුල් සමග වැඩ කිරීම
- තරුණයින් සමග වැඩකිරීමේ උපායමාර්ග
- සිද්ධීන් ඉදිරිපත්කිරීම්
- මත්ද්‍රව්‍ය වලින් නිදහස් ගම්මාන / වැඩබිම් / ආයතන

**II. ප්‍රජා පාදක ප්‍රතිකාර ප්‍රවේශ**

- සුවවීමේ කණ්ඩායම් සම්බන්ධයෙන් සාර්ථකවූ කතාන්දර
- ප්‍රතිකාර සේවාවන් ඒකාබද්ධ කිරීම
- ප්‍රජාව තුළ සහාය දැක්වීමේ පද්ධතීන්
- පසුරැකවරණ වැඩසටහන්
- කෙටි කාලීන ප්‍රජා පාදක ප්‍රතිකාර කඳවුරු
- පවුල් සමග වැඩ කිරීම
- ප්‍රජා ප්‍රතිකාරය තුළ සාර්ථකවූ කතාන්දර
- විශේෂිත ජනගහන කණ්ඩායම් සඳහා මැදිහත්වීම්
- පුද්ගලයින් සහ පවුල් සඳහා සහාය දැක්වීමේ පද්ධතීන්

**III. ප්‍රජා මැදිහත්වීම් පිළිබඳ සාර්ථක වූ කතාන්දර සහ වඩාත් හොඳ භාවිතාවන්**

- ඵලදායී ප්‍රජා වැඩසටහන් සම්බන්ධ සිද්ධි අධ්‍යයන
- ප්‍රජා වැඩ හරහා උගත් පාඩම්
- අනෙකුත් ප්‍රජාවන් සඳහා යොදාගත හැකි ආකෘති

### IV. ප්‍රජා වැඩ කිරීමේදී ඇතිවන අභියෝග සහ ඒවාට විසඳුම්

- ප්‍රජාවේ සහභාගීත්වය සම්බන්ධ බාධාවන් අවම කරගැනීම
- ප්‍රජා වැඩසටහන්වල තිරසාරබව
- ප්‍රජාවේ ඇති සම්පත් සපයා ගැනීමේ උපායමාර්ග

### V. ප්‍රජා මැදිහත්වීම්වලදී නව තාක්ෂණය භාවිතය

- ප්‍රජා වැඩසටහන්වලදී නව තාක්ෂණය භාවිතය
- ඩිජිටල් බාහිරසේවාව ඇතුළත් නව බාහිරසේවා ආකෘති
- ප්‍රජාව සමග වැඩකිරීමේ නව ආකෘති

### VI. ප්‍රජා මැදිහත්වීම් ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උද්දේශනය

- උද්දේශන උපායමාර්ග
- ප්‍රතිපත්තිමය බලපෑම්
- පාර්ශ්වකරුවන් අතර හවුල්කාරීත්වයක් ගොඩනැගීම

## 2. පර්යේෂණ සාරසංක්ෂේප (Abstracts) / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා සම්පාදනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ

### I. පොදු උපදෙස්

- පර්යේෂණ සාරසංක්ෂේප / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර සම්බන්ධයෙන් ප්‍රජා වැඩ කටයුතු තුළින් ලබාගත් අත්දැකීම් හෝ ඒ ආශ්‍රිත පර්යේෂණ මත විය හැකිය. පර්යේෂණ සාරසංක්ෂේප / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා සත්‍ය පර්යේෂණ අධ්‍යයන සහ සැබෑ ප්‍රජා අත්දැකීම් මත ඉදිරිපත් කළ යුතුය.
- නිර්දේශිත මාර්ගෝපදේශවලට අනුකූල නොවන පර්යේෂණ සාරසංක්ෂේප / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා ප්‍රතික්ෂේප කරනු ඇත.
- නියමිත දිනට නොලැබෙන පර්යේෂණ සාරසංක්ෂේප / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා භාර ගැනීම සිදුනොවේ.
- භාෂාව - සිංහල හෝ ඉංග්‍රීසි
- කෙටි සාරසංක්ෂේප වචන 350 ක් උපරිමයකට සහ විස්තාරික සාරසංක්ෂේප වචන 1200 ක උපරිමයකට සීමාවිය යුතුය.
- කෙටි සාරසංක්ෂේප - වචන 350, දිශානතිය, ක්‍රමවේදය සහ අනාවරණ වලින් සමන්විත විය යුතුය.
- විස්තාරිත සංක්ෂේප වචන 1200 නොඉක්මවිය යුතුය.
- ආකෘතිය: පර්යේෂණ පත්‍රිකා මාතෘකාව තුළ කතෘන්, ආයතනය, කෙටි සාරසංක්ෂේපය, මූඛ්‍ය පද, හැඳින්වීම, ක්‍රමවේදය, ප්‍රතිඵල , සාකච්ඡාව, නිගමනය සහ ආශ්‍රිත ග්‍රන්ථ යන කාරණා ඇතුළත්විය යුතුය.
- Font – සිංහල FMAbhaya / English – Times New Roman
- වචන සීමාව - වචන 1200 නොඉක්මවිය යුතුය.

- පර්යේෂණ පත්‍රිකා / ප්‍රජා අත්දැකීම් පිළිබඳ වාර්තා මෙම විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. outreachnddcb@gmail.com

## II. පර්යේෂණ සාරසංක්ෂේප සඳහා මාර්ගෝපදේශ

**මාතෘකාව සහ හැඳින්වීම**

- පර්යේෂණ මාතෘකාව පැහැදිළිව සඳහන් කළ යුතුය.
- පර්යේෂණ මාතෘකාවට කෙටි හැඳින්වීමක් සහ පසුබිමක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.
- මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරයට එහි අදාළත්වය පැහැදිළි කිරීම අවශ්‍යවේ.

**පර්යේෂණ ගැටලුව:**

- පර්යේෂණය හරහා ආමන්ත්‍රණය කරන ගැටලුව කෙටියෙන් විස්තර කරන්න.
- එම පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම පැහැදිළි කරන්න.

**අරමුණු:**

- ප්‍රධාන අරමුණු පැහැදිළිව සඳහන් කරන්න.
- පර්යේෂණය හරහා ළඟාකර ගැනීමට අපේක්ෂා කළ දේ පැහැදිළි කරන්න.

**ක්‍රමවේදය:**

- පර්යේෂණ ක්‍රමයෙවිදය පැහැදිළි කරන්න
- නියැදිය සහ දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම
- දත්ත විශ්ලේෂණ ශිල්ප ක්‍රම

**ප්‍රතිඵල:**

- මූලික අනාවරණ සාරාංශගත කරන්න.
- දත්ත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රස්තාර සහ වගු භාවිත කළ හැකිය
- සැළකිය යුතු අනාවරණ සහ ප්‍රවණතා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්න.

**සාකච්ඡාව:**

- පර්යේෂණ අනාවරණ අර්ථකථනය කරන්න.
- පර්යේෂණ අනාවරණ වෙනත් ද්විතීයික මූලාශ්‍ර සමග සංසන්දනය කරන්න.
- පර්යේෂණ සීමාවන් සහ ඉදිරි පර්යේෂණ සඳහා යෝජනා.

**නිගමන:**

- පර්යේෂණ අනාවරණවල සාරාංශයක් ඉදිරිපත් කරන්න.

- මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය සඳහා පර්යේෂණ අනාවරණ වල ඇති වැදගත්කම ඉස්මතු කරන්න.
- පර්යේෂණ අනාවරණ මත පදනම්ව ඉදිරි යෝජනා ඉදිරිපත් කරන්න.

**<u>ආශ්‍රිත ග්‍රන්ථ:</u>**

භාවිත කළ සියලු මූලාශ්‍ර සම්මත පරිශීලන ක්‍රමයකට අනුව පෙළ ගස්වන්න (e.g., APA,).

## III. ප්‍රජා අත්දැකීම් මත පදනම්වූ පත්‍රිකා සඳහා මාර්ගෝපදේශ

**<u>මාතෘකාව සහ හැඳින්වීම:</u>**

- මාතෘකාව පැහැදිළිව සඳහන් කළ යුතුය.
- ප්‍රජා අත්දැකීම පිළිබඳ හැඳින්වීම පසුබිම සහ සංන්ධර්භය පිළිබඳ සඳහන් කරන්න

**<u>අදාළ ප්‍රදේශය:</u>**

ප්‍රජා අත්දැකීම ලබාගත් භූගෝලීය ප්‍රදේශය සඳහන් කරන්න.

**<u>නියෝජනය වන ප්‍රජාව / කණ්ඩායම් සහ සංවිධාන:</u>**

- ඒ සඳහා සම්බන්ධ පුද්ගලයින් / ප්‍රජාවන් / පාර්ශ්වකරුවන් සහ සංවිධාන පිළිබඳ සඳහන් කරන්න.
- අදාළ ප්‍රජා අත්දැකීම සඳහා ඒවායේ භූමිකාව පැහැදිළි කරන්න.

**<u>භාවිත කළ ආකෘති:</u>**

- ප්‍රජා වැඩවලදී භාවිත කළ ආකෘති සහ ප්‍රවේශ සම්බන්ධයෙන් සඳහන් කරන්න.
- එම ආකෘති ක්‍රියාත්මක කළ ආකාරය පැහැදිළි කරන්න

**<u>ප්‍රතිඵල සහ නිර්නායක:</u>**

- ප්‍රජා වැඩ වලින් ලබාගත් මූලික ප්‍රතිඵල පැහැදිළි කරන්න.
- ප්‍රගතිය හෝ සාර්ථකත්වය මැනීම සඳහා නිර්ණායක භාවිත කළේ නම් සඳහන් කරන්න.

**<u>තිරසාරබව:</u>**

- ප්‍රජා වැඩවල තිරසාරබව පිළිබඳ සාකච්ඡා කරන්න.
- ප්‍රජා වැඩ වලින් අඛණ්ඩ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා යම් උපායමාර්ගයක් හෝ සැලසුමක් ඇත්නම් පැහැදිළි කරන්න.

**අභියෝග සහ විසඳුම්:**

- ප්‍රජා වැඩවලදී මුහුණදුන් යම් අභියෝග වේ නම් හඳුනාගෙන සඳහන් කරන්න.
- එම අභියෝග ජයගත් ආකාරය සඳහන් කරන්න.

**අනෙකුත් අදාළ අංශ:**

- ප්‍රජා වැඩවලට සම්බන්ධ අමතර තොරතුරු වේ නම් ඉදිරිපත් කරන්න.
- මේ තුළ සංස්කෘතිකමය කාරණා උගත් පාඩම් සහ අනපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් විය හැකිය.

**නිගමනය:**

- ප්‍රජා වැඩ පිළිබඳ මූලික කාරණා සාරාංශගත කරන්න.
- ප්‍රජා වැඩවල සමස්ත බලපෑම අවධාරණය කරන්න.
- ඉදිරියේදී කිරීමට නියමිත එවැනි ප්‍රජා වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන්න.

**මූලාශ්‍ර:**

අදාළ වේ නම් පමණක් ලැයිස්තු ගත කරන්න.

## 3. ඉදිරිපත් කිරීමේ ආකරය

- තෝරාගනු ලබන සෑම පත්‍රිකාවක්ම විනාඩි 15 ක කාලයක් තුළ ඉදිරිපත් කළ යුතුය.
- උපරිම powerpoint slides 10 කට සීමා වීම වඩාත් පහසු වේ.
- අනෙකුත් අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේ නම් වඩාත් යෝග්‍යවේ.

## 4. ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛන

- ඉදිරිපත් කරන්නාගේ / කතෘගේ කෙටි ජීව දත්ත සටහනක්
- ඉදිරිපත් කරන්නාගේ ප්‍රකාශනයක්
- අචාරධර්මවලට අනුකූලවීම සම්බන්ධයෙන් ලබාගත් අනුමැතියට අදාළ ලේඛණ (අදාළ නම් පමණක්)

## 5. වැදගත්වන දින –

පත්‍රිකා කැඳවීම – 2024 සැප්තැම්බර් 01

පත්‍රිකා යොමු කළ යුතු අවසන් දිනය –2024 නොවැම්බර් 15

තෝරාගැනීම් පිළිබඳ දැනුම්දීම – 2024 නොවැම්බර් 25

පර්යේෂණ සැසිය –2024 දෙසැම්බර් 04

## 6. ලියාපදිංචිය

ශිෂ්‍යයින් සඳහා – රු. 1500.00

සාමාන්‍ය – රු. 3000.00

For more information, please visit our web site – www.nddcb.gov.lk

Conference Chair – Chairman of NDDCB

chairman@nddcb.gov.lk

Conference Secretary – Mr. A.T. Darshana, Assistant Director – Outreach

+94713533367

outreachnddcb@gmail.com

darshanathamara@gmail.com